# 9 බුදුරදුන් අනුදත් නිදහස් චින්තනය

බුදු දහමෙහි ඇති විශිෂ්ට ලක්‍ෂණයක් නම් බුදුරදුන් පිළිබඳවත් උන්වහන්සේගේ ධර්මය පිළිබඳවත් විමසීමකට හා ප්‍රශ්න කිරීමට ශ්‍රාවකයන්ට දී ඇති නිදහසයි. ලෝක ආගම් ඉතිහාසයෙහි අන් කිසිදු ආගමක දක්නට නොලැබෙන මෙම ලක්‍ෂණය බුදුරදුන්ගේ ඉගැන්වීමෙහි විවෘත ස්වභාවය පැහැදිලි කරන්නකි.

මෙම පාඩමෙන් අපි නිදහස් චින්තනය පිළිබඳ ව බුදුරදුන්ගේ සුප්‍රකට ප්‍රකාශය ඇතුළත් කාලාම සූත්‍රය ද ඒ හා සමාන වෙනත් දේශනා ද හදාරමු. සිතීමට හා විමසීමට බුදුදහමෙහි අපට ලබා දී ඇති නිදහසෙහි අරුත කුමක් ද යනු තේරුම් ගැනීමට ද අපි මේ සාකච්ඡාවෙන් උත්සාහ දරමු.

## 9.1 හැඳින්වීම

නිදහස් චින්තනය හා ආගම යන විෂය දෙක සැමවිට ම එකිනෙක හා ඉතා හොඳින් ගැළපෙන්නේ නැත. එයට හේතුව සාමාන්‍යයෙන් ආගම්වලින් ප්‍රකාශ වන කරුණු අප වෙත ඉදිරිපත් කෙරෙනුයේ සියල්ල දත් දෙවි කෙනකුගේ ප්‍රකාශ ලෙස බැවිනි. දේවවාදී ආගම් හෙවත් ලොව එබඳු දෙවි කෙනකු විසින් මවන ලද බව පිළිගන්නා ආගම්වල එබඳු ප්‍රකාශ දක්නට ලැබේ. ඒවා ප්‍රශ්න කිරීමකින් තොර ව පිළිගත යුතු ව ඇත. එහෙත් අදේවවාදී ආගමක් වන බුදුදහමෙහි එසේ පිළිගත යුතු ප්‍රකාශ නැත. බුදුරදුන් දේශනා කළ ධර්මය පිළිබඳව ප්‍රශ්න කිරීමට ඉඩ බුදුදහමෙහි ඇත. අප උන්වහන්සේගේ ධර්මය පිළිගත යුත්තේ ඒවා සත්‍ය බව හා නිවැරැදි බව අපට ඒත්තු යන්නේ නම් පමණි.

එහෙත් මෙහිදී මතුවන ප්‍රශ්නයක් නම්: බුදුරදුන් දේශනා කළ කරුණක් සත්‍ය යැයි හෝ නිවැරැදි යැයි හෝ අපට ඒත්තු නොයේ නම් එය බැහැර කිරීමට අපට ඉඩ තිබේ ද යනුයි. මෙම ප්‍රශ්නයට පිළිතුර ‘නැත’ යනුයි. බුදුරදුන් දේශනා කළ ධර්මය නිවැරැදි සේ හෝ සත්‍ය සේ හෝ අපට නො වැටහේ නම් අප කළ යුත්තේ එය වටහා ගැනීමට හැකිවන පරිදි සත්‍ය අසත්‍ය, වැරැදි නිවැරැදි කරුණු පිළිබඳ අපගේ අවබෝධය වැඩි දියුණු කර ගැනීම ය. බුදුරදුන් තම ඥානයෙන් අවබෝධ කළ ධර්මය නිවැරැදි හා සත්‍ය බව උන්වහන්සේ තම අත්දැකීමෙන් දුටු සේක. එහෙත් එය පිළිගැනීම සඳහා අපට එය ඒත්තු ගොස් තිබිය යුතු ය. ධර්මය අනුගමනය කිරීමේ ඉතා ම නිවැරැදි ක්‍රමය නම් එය අවබෝධයෙන් අනුගමනය කිරීම බැවිනි.

මේ අනුව පෙනී යන්නේ බුදුරදුන් අපට ඉඩ දී ඇති නිදහස් චින්තනය යනු අප එක් එක්කෙනාහට ගැළපෙන බුදු දහමක් නිර්මාණය කර ගැනීමට දී ඇති නිදහසක් නො වන බවයි. නිදහස් චින්තනය හා ප්‍රශ්න කිරීම අප භාවිත කළ යුත්තේ නිවැරැදි අවබෝධය කරා සමීප වීමට ය.

## 9.2 කාලාම සූත්‍රය

(i) වරක් බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා සමග චාරිකාවෙහි වඩින අතර කාලාම නම් ජන කොටසට අයත් කේසපුත්ත නම් ගමට වැඩිසේක. එහි දී උන්වහන්සේ හමුවීමට පැමිණි කාලාමයෝ බුදුරදුන්ට මෙසේ පැවසූහ: ස්වාමීනි, මේ ගමට එන සමහර මහණ බමුණෝ අනුන්ගේ ඉගැන්වීම්වලට පරිභව කරමින් තම ඉගැන්වීම් උසස් කොට දක්වති. තවත් සමහර මහණ බමුණෝ ද තම ඉගැන්වීම් පමණක් උසස් කොට දක්වමින් අන් මහණ බමුණන්ගේ ඉගැන්වීම් පහත් කොට දක්වති. ස්වාමීනි, මෙම මහණ බමුණන් අතුරෙන් කවරෙක් නම් සත්‍ය කියත් ද, කවරෙක් අසත්‍ය කියත් දැයි අපට සැකයක් විමතියක් ඇති ව තිබේ.

එවිට බුදුරදහු: කාලාමයෙනි, ඔබට සැක ඇතිවීම ඉතා සුදුසු ය. ඔබට සැක ඇතිවී තිබෙන්නේ සැක ඇති කර ගත යුතු කරුණක් පිළිබඳ ව ම ය. කාලාමයෙනි, i. ආගමික

හෙළිදරව්වක් බැවින් හෝ ii. පරම්පරාගත ව පැවැතෙන විශ්වාසයක් හෙයින් හෝ, iii. "මෙසේ වී යැ" යි යන පිළිගැනීම හේතුවෙන් හෝ, iv. පූජනීය ග්‍රන්ථයක සඳහන් බැවින් හෝ, v. තර්කානුකූල බැවින් හෝ, vi. ක්‍රමානුකූල බැවින් හෝ, vii. යම් කරුණක ස්වරූපය ගැන සිතා සෑහීමට පත්වීමෙන් හෝ, viii. තමා පිළිගත් දෘෂ්ටිය හා ගැළපෙන හෙයින් හෝ, ix. අදහස ප්‍රකාශ කරන පුද්ගලයා පිළිගත් කෙනෙකු බැවින් හෝ, x. අදහස ප්‍රකාශ කරන පුද්ගලයා තම ගුරුවරයා බැවින් හෝ කිසිවක් නො පිළිගන්න.

කාලාමයෙනි, මෙම කරුණු අකුසල ය, මෙම කරුණු වරද සහිත ය, මෙම කරුණු නුවණැත්තන් විසින් ගරහන ලද ය, මෙම කරුණු පිළිපැද්දහොත් අයහපත හා දුක ඇති වේ යැයි තමාට ම වැටහන්නේ නම් එවිට ඒවා දුරු කරන්න.

(ii) අනතුරු ව බුදුරදහු ලෝභ, දෝස හා මෝහ යන අකුසල මුල් තුන (1.2 ඒකකය බලන්න.) එකක් එකක් ගෙන ඒවා පිළිබඳ ව ඔවුන්ගෙන් ප්‍රශ්න කළහ. ඒවා කෙනකු තුළ ඇතිවීමෙන් අයහපත සිදුවන බවත්, ඒවා හේතු කොට ගෙන එම පුද්ගලයා තමා ද පව් කම් කරන අතර අනුන් ද ඒ සඳහා යොදවන බවත් ඒ අනුව ඒවා අකුසල බවත් වරද සහිත බවත් නුවණැත්තන් විසින් ගරහන ලද බවත් පිළිපැද්දහොත් අයහපත හා දුක පිණිස හේතුවන බවත් ඔවුහු පිළිතුරු වශයෙන් ප්‍රකාශ කළහ. එවිට බුදුරදුන් ඔවුන්හට පැහැදිලි කළේ එසේ තම අවබෝධයෙන් පමණක් ම යමක් අයහපත ලෙස පිළිගත යුතු බවත්, ඉහත කී දස හේතු වලින් එකක් නිසා හෝ නො පිළිගත යුතු බවත් ය.

අනතුරුව බුදුරදහු අලෝභ, අදෝස, අමෝහ යන කුසල් මුල් තුන ගෙන ඒවා පිළිබඳව ද ඉහත දැක්වූ ආකාරයෙන් ම කාලාමයන්ගෙන් ප්‍රශ්න කළහ. ඒ අනුව එම කුසල් මුල් කෙනකු තුළ ඇතිවීම යහපත පිණිස හේතුවන බවත්, ඒවා හේතු කොට ගෙන පස්පවින් තමා ද වැළකී අනුන් ද ඉන් වළකන බවත්, ඒවා කුසල බවත්, නිවැරැදි බවත්, නුවණැත්තන් විසින් ප්‍රශංසා කරන ලද බවත්, පිළිපැද්දහොත් යහපත හා සැප පිණිස හේතු වන බවත් ඔවුහු පිළිතුරු වශයෙන් ප්‍රකාශ කළහ. එවිට බුදුරදුන් ඔවුන්ට පැහැදිලි කළේ එසේ තම අවබෝධයෙන් ම පමණක් යහපත් දෑ යහපත් ලෙස පිළිගත යුතු බවයි.

(iii) මෙසේ යහපත හා අයහපත පිළිබඳ ව තම අවබෝධයෙන් ම දැන අයහපත දුරු කොට යහපතෙහි යෙදෙන ආර්ය ශ්‍රාවකයා දැඩි ලෝභයෙන්, ද්වේෂයෙන් හා මෝහයෙන් බැහැර වී මෙත්තා, කරුණා, මුදිතා හා උපෙක්ඛා යන **සතර බ්‍රහ්ම විහාර** සිවු දිසාවෙහි ද, උඩ යට හා සිරස් ව ද පතුරුවමින් වෙසෙයි. වෛරයෙන් තොර, ද්වේෂයෙන් තොර අපරිමාණ වූ සිත සියලු දිශාවන්හි පතුරුවයි. එසේ හැසිරෙන එම ආර්ය ශ්‍රාවකයාහට සැනසුම් සතරක් මෙම ජීවිතයෙහි දී ම ලැබේ.

i. "ඉදින් පරලොවක් තිබේ නම්, හොඳ නරක කර්මවලට විපාක ලැබේ නම් මම මරණින් පසු යහපත් සැපවත් ලොවක ඉපදෙමි" යි සිතා සැනසීම ලබයි.

ii. "ඉදින් පරලොවක් නැති නම් හොඳනරක කර්මවලට විපාක නො ලැබේ නම් මම මේ ජීවිතයෙහි වෛරයෙන් හා බද්ධ වෛරයෙන් තොර ව සුවසේ වෙසෙමි" යි සිතා සැනසීම ලබයි.

iii. "ඉදින් කිසියම් ක්‍රියාවක් කරන්නාට පාපයක් සිදුවේ නම් මා අනුන්හට පාපී චේතනාවක් නො සිතන බැවින් පවු නො කරන මාහට කෙසේ දුක් ලැබේද" යි සැනසීම ලබයි.

iv. "ඉදින් කිසියම් ක්‍රියාවක් කරන්නාහට පාපයක් සිදු නොවේ නම් මම (තමා පවු නො කිරීම හා කරන්නාහට පව් සිදු නොවී ම යන) අංශ දෙකෙන් ම පිරිසිදු ජීවිතයක් ගත කරමි"යි සිතා සැනසීම ලබයි.

බුදුරදුන්ගේ මෙම ධර්ම දේශනාවට සවන් දුන් කාලාමයෝ අතිශයින් සිත සතුටු ව තෙරුවන් සරණ ගිය උපාසක පිරිසක් බවට පත් වූහ.




chap 9 ok.pmd 87 6/7/2006, 1:48 PM

## 9.3 සැක කිරීම හා ප්‍රශ්න කිරීම

කාලාම සූත්‍රයෙන් බුදුරදුන් අපට පෙන්වා දෙන ඉතා වැදගත් කරුණක් නම් සැක ඇතිවිය යුතු කරුණු පිළිබඳව සැක කිරීමටත්, ප්‍රශ්න කළ යුතු කරුණු පිළිබඳව ප්‍රශ්න කිරීමටත් ශ්‍රාවකයන්හට නිදහස ඇති බවයි. සැක කිරීම පාපයක් ලෙසත්, ප්‍රශ්න කිරීම අකීකරු වීමක් හා අවනත නොවීමක් ලෙසත් සමහර ආගම්වල උගන්වනු ලැබේ. එහෙත් කාලාමයන්ගේ සැකය පිළිබඳව බුදුරදුන් පවසනුයේ ඔවුන්ට සැක ඇතිවීම ඉතා සාධාරණ බවයි.

සැක කිරීමට බුදුරදුන් ඉඩ දේ නම් එය විචිකිච්ඡා යන නමින් නීවරණ ධර්මයක් ලෙස දක්වා තිබෙන්නේ කුමක් නිසාදැයි කෙනකුට ප්‍රශ්නයක් ඇතිවිය හැකි ය. නීවරණ යනු සංසුන් වීමට ඉඩ නොදී සිත ආවරණය කරන කරුණු පහකි. මෙම ආවරණය කිරීමේ ස්වභාවය සෑම පෘථග්ජන සිතක ම පවතී. අතීරණය, චංචල බව හා කරුණු කීපයක් අතර දෝලනය වීම එහි ලක්ෂණ වේ. එහෙයින් එය බලපවත්වන තුරු සිතෙහි එකඟ බව ඇතිවන්නේ නැත. එය නීවරණයක් වන්නේ එබැවිනි. එහෙයින් එය දුරු කළ යුතු දෙයක් විනා පාපයක් නො වේ.

මෙහි දී අප විසින් වටහා ගත යුතු ඉතා වැදගත් කරුණක් නම් බුදුරදුන් කාලාමයන්ට තම නුවණින් තේරුම් ගත යුතු ලෙස පෙන්වා දෙන්නේ සදාචාරය පිළිබඳ කරුණක් බවයි. එහි දී පවා නුවණැත්තන් විසින් ගැරහීම හෝ ප්‍රශංසා කිරීම යමක් ප්‍රතික්ෂේප කිරීමට හෝ පිළිගැනීමට හේතුවක් ලෙස දක්වා තිබීමෙන් පෙනෙනුයේ අපට අපගේ ඥානය පමණක් ම ප්‍රමාණවත් විය නො හැකි බවයි. කාලාම සූත්‍රය බුදුරදුන් දේශනා කළේ ඥානය මුහුකුරා ගිය වැඩිහිටි පිරිසකට ය. එබඳු පිරිසකට දේශනා කළ ධර්මය වර්තමානයෙහි අදාළ වන්නේ ද එබඳු මුහුකුරා ගිය පිරිසක්හට පමණි. ඒ තත්ත්වයට පත්ව නැති අපි සියලු දෙන, ඒ තත්ත්වයට පත්වන තුරු නුවණැත්තන්ගේ අදහස් ද, වැඩිහිටි ඔවදන් ද අනුව හික්මිය යුතු ය. මුහුකුරා ගිය කෙනකු වන තුරු කිසිම කෙනකුට තමාගේ අවබෝධයෙන් හෝ තීරණයෙන් හෝ පමණක් ක්‍රියා කළ නො හැකි ය. කාලාම සූත්‍රයෙන් එබඳු නිදහසක් අපට දෙන්නේ යැයි සිතීම වරදකි.

## 9.4 සාරාංශය

සිතීමටත් විමසීමටත්, සැක කිරීමට හා ප්‍රශ්න කිරීමටත් බුදු දහමෙන් අපට අනුබල ලැබෙන්නේ එමඟින් තම තීරණ පිළිබඳව තමාට ම වගකීම දැරීමට හැකි පරිණත පුද්ගලයන් බවට අප පත් කරනු සඳහා ය. සැක කිරීමට හා ප්‍රශ්න කිරීමට අප තුළ ඇති නැඹියාව යහපත් අතට යොදා ගත යුතු ය. එම නැඹියාව හුදෙක් අවිනිශ්චිතතාවට හා අතීරණයට පමණක් හේතු වුවහොත් එය නීවරණයක් බවට පත් වී අපට හානිය පිණිස පවතී. තවත් ලෙසකින් කියතොත්, සැකයෙන් පටන් ගෙන අප ඥානය කරා ගමන් කළ යුතු ය. කාලාම සූත්‍රයෙහි සමස්ත අර්ථය ලෙස ගත හැක්කේ එයයි.



chap 9 ok.pmd 88 6/7/2006, 1:48 PM

## අභ්‍යාස

1. දේවවාදී හා අදේවවාදී (ආගම්) යන දෙකෙහි වෙනස පැහැදිලි කරන්න.
2. කාලාම සූත්‍රයෙහි බුදුරදුන් පෙන්වා දී ඇති යමක් පිළිගැනීම සඳහා ඒකාන්ත ම හේතු සේ නො ගත යුතු කරුණු දහය නම් කරන්න.
3. සදාචාරවත් ජීවිතයක් ගත කරන පුද්ගලයා මෙම ජීවිතයේ දී ම ලබන සැනසිලි සතර කෙටියෙන් දක්වන්න.

## පැවරුම්

1. "කාලාම සූත්‍රයෙන් ඉගැන්වෙන සිතීමේ හා විමසීමේ නිදහස" යන මැයෙන් කෙටි රචනයක් ලියන්න.
2. ජීවිතයේ සියලු ම කරුණු සම්බන්ධයෙන් අපට අපගේ ම අත්දැකීමෙන් පමණක් ක්‍රියා කළ හැකි ද? එසේ නොහැකි සේ පෙනෙන කරුණු තුනක් කෙටියෙන් දක්වන්න.
3. "කිසියම් කරුණක් පිළිබඳව ඇති කර ගන්නා සැකය යහපතට මෙන් ම අයහපතට ද හේතු විය හැකි ය" මෙය පැහැදිලි කරමින් ඡේදයක් ලියන්න.
4. පහත සඳහන් වචනවල තේරුම සොයා සටහන් පොතට එකතු කර ගන්න:

| | | |
|---|---|---|
| i. හෙළිදරව්ව | ii. මෙත්තා | iii. කරුණා |
| iv. මුදිතා | v. උපෙක්ඛා (උපේක්ෂා) | vi. පාරම්පරික |

## අතිරේක කියවීම්

1. කාලාම සූත්‍රය (අංගුත්තර නිකාය තික නිපාත, මහාවග්ග)
2. කාලාම සූත්‍රය හා චින්තන නිදහස (සනත් නානායක්කාර, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල)